**සාරාංශය**

දඬුවම් පිළිබඳ ගුරු හා සිසු සංජානන විමසා බැලීම පදනම් කොට ගෙන මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කළ අතර, 2001 වර්ෂය පාදක වර්ෂය ලෙස යොදා ගන්නා ලදී. මෙම අධ්‍යයනය සඳහා බස්නාහිර පළාතට අයත් හොරණ අධ්‍යාපන කලාපයේ බණ්ඩාරගම අධ්‍යාපන කොට්ඨාසයේ ගුරු හා සිසු පිරිසක් යොදා ගැනිණ.

දඬුවම් දීමෙන් ශිෂ්‍ය විනය ගොඩ නගා ගත හැකි ය. යන අකල්පය පාසල තුළ මෙන් ම නිවස තුළ ද ප්‍රබල වන අතර ම මෙම ආයතන දෙක අඩු වැඩි වශයෙන් දරුවන් සම්බන්ධයෙන් දඬුවම ක්‍රියාත්මක කරන බව පෙනී යයි. කායික දණ්ඩනය ද නිවසින් ආරම්භ වී පාසල කරා ව්‍යාප්ත වී ඇත. එසේ ම දඬුවමේ ඵලදායීතාව පිළිබඳව ද විවිධ මතිමතාන්තර පවතී. මේ තත්ත්වය සම්බන්ධයෙන් ගුරු සිසු සංජානන සොයා බැලීම සඳහා මෙම අධ්‍යයනය සැකසිණි.

මේ සඳහා පූර්ව පර්යේෂණ සොයා බැලීමට සාහිත්‍ය විමර්ශනය මඟින් හැකි වූ අතර විවිධ පත පොත, පර්යේෂණ කෘති, පුවත්පත් වාර්තා ඒ සඳහා යොදා ගැනිණි.

ඒ අනුව පර්යේෂණ අරමුණු පංච විධ ආකාරයකින් සැකසිණි.
ශිෂ්‍යයින් ලබන දඬුවම්, ඊට හේතු, සිසු සංජානන, ගුරු සංජානන, හා දඬුවම වෙනුවට විකල්ප ක්‍රියාමාර්ග අරමුණු සඳහා පදනම් කොට ගැනිණි.

ඒ අනුව පාසල් 13 කින් ගුරුවරු 75 ක් හා 9, හා 10 ශ්‍රේණී වලින් ශිෂ්‍යයින් 100 ක් නියැදිය ලෙස යොදා ගැනීමට සැලසිණි. දත්ත රැස් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රශ්නාවලී හා සම්මුඛ සාකච්ඡා යන ක්‍රම අනුගමනය කරන ලදී. දත්ත විශ්ලේෂණය කිරීමේ දී ප්‍රතිශත මඟින් එය ඉදිරිපත් කරන ලදී.

සිසු නියැදිය 9, 10 ශ්‍රේණී ලෙස කොට විශ්ලේෂණය කෙරිණි. එහි ද ප්‍රබල වෙනසක් සංජානනයන්හි දක්නට නොලැබිණි.

මෙම අධ්‍යයනයෙන් අනාවරණය වූ කරුණු අතර විවිධ දඬුවම් වර්ග පාසල්වල හා නිවසේ තවමත් පවතින බවත්, දඬුවම් අනුමත නොකරන ගුරු පිරිසක් සිටින අතර දඬුවම වෙනුවට විකල්ප ක්‍රියා මාර්ග ලෙස ප්‍රබෝධවත් පන්ති කාමරය පිළිබඳව අදහස් දැක්වීම ද අනාවරණය විය.

ගුරුවරුන්ගේ දඬුවම් සිසු මනසේ ප්‍රකෝපය හා වේදනා ජනිත කරවන අවස්ථා ඇති කරන බවත්, දඬුවම අනුමත නොකරන පිරිස වැඩි බවත්, සිසු සංජානන මඟින් අනාවරණය විය. ඒ අනුව ගතහැකි විකල්ප ක්‍රියා මාර්ග පිළිබඳ ව යෝජනා මාලාවක් ද ඉදිරිපත් කෙරේ.